රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 22/99 (XXIX)

මගේ අංකය :- EST-7/TPORT/05/1012
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.
2013.10.31

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**1999.10.08 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 අනුව රජයේ නිලධරයන්ට විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී ලබා දෙන අනුග්‍රාහාත්මක වාහන ආනයන බලපත්‍රයේ වටිනාකම සියළු විදේශ මුදල් සම්බන්ධයෙන් නිශ්චිත දිනකට තීරණය කිරීම**

“රජයේ නිලධාරීන් / අධිකරණ නිලධාරීන් / රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල නිලධාරින් සඳහා නිල ප්‍රවාහන පහසුකම්” මැයෙන් නිකුත් කරන ලද 1999.10.08 දිනැති අංක 22/99 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ එකී චක්‍රලේඛයේ විධිවිධාන සංශෝධන කරමින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ කෙරේ ඔබේ අවධානය යොමු කරවමි.

02. ඉහත චක්‍රලේඛයේ විධිවිධාන යටතේ නිකුත් කරනු ලබන වාහන ආනයන බලපත්‍රයක වටිනාකම ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ගණනය කිරීම බලපත්‍රලාභියා විසින් ණයවර ලිපි විවෘත කිරීමේ දිනට අදාළ ඇමරිකානු ඩොලරයේ වටිනාකම මත කළ යුතුය.

03. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාවය මත නිකුත් කරන ලදී.

පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.